**කුරුණෑගල මහා නගර සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 12 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 22 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 30 දින ද සභාවට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ වැඩියෙන් ගිණුම්ගත කළ වැටුප් ප්‍රතිපූර්ණ රු.15,602,242 ක් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනය සමඟ සාකච්ඡා කර මෙය නිවැරදි කරන බවට දන්වා සිටිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් උසාවි දඩ සඳහා අදාළ වෙන් කිරීම් සිදුකර නොතිබූ අතර ලේඛන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ශේෂය රු.17,496,300 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු.16,367,850 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට නොවැම්බර් හා දෙසැම්බර්වලට අදාළ උසාවි දඩ ඇස්තමේන්තු කර හිඟ ආදායම් නියමිත පරිදි අවසන් ගිණුම්වලට ඇතුලත් කරන ලෙස විෂය භාර නිලධාරිට උපදෙස් ලබා දුනි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩකුලී ශේෂය තුල හා අදාළ ගිණුම්වල රු.301,492 ක දඩ මුදල් හා රු.525,000 ක සේවා ගාස්තු ආදායමක් ඇතුලත්ව තිබීමෙන් රු.826,492 කින් ජංගම වත්කම් හා වර්ෂයේ අතිරික්තය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ආදායම් ලැබීම් නිවැරදිව හඳුනාගෙන අදාළ ගිණුම්වලට සටහන් කිරීමට කටයුතු කළ යුතුවේ. | පසුව පිළිතුරු සපයමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මුද්දර ගාස්තු සඳහා අදාළ වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | වර්ෂයට අදාළ ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | මෙම වර්ෂයේ සිට නිවැරදි කිරීමට උපදෙස් ලබා දුනි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ජල ආදායම් බිල් කිරීම් රු.118,598,186 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.120,246,151 ක් ලෙස දක්වා තිබුණි. | ලේඛන අනුව නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙය ගිණුම් මගින් නිවැරදි කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. |
| (ඊ) | සේවක ණය ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට අයවිය යුතු සේවක ණය ශේෂය රු.43,809,580 ක් වුවත් එය මූල්‍ය ප්‍රකාශනවල රු.45,235,765 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සේවක ණය රු.1,426,185 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | සේවක ණය ලේඛනය නිවැරදිව යාවත්කාලීන කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | සේවක ණය ගිණුමෙහි පෙන්වා ඇති වෙනස්කම් කඩිනමින් නිවැරදි කරන බව දන්වා සිටිමි. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගනු ලැබූ ආයුධ මෙවලම් හා උපකරණ රු.651,866 ක් වුවත් එය එම ගිණුමට රු.32,361,601 ක් ලෙස හර කිරීම නිසා ආයුධ මෙවලම් හා උපකරණ රු.31,709,735 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | වර්ෂයේ මිලදී ගැනීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | එවැනි වැරදි ඉදිරියට නොවීමට නිලධාරීන්ට උපදෙස් දුණි. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ ලී බඩු හා සවිකිරීම් මිලදී ගැණුම් රු.9,467,915ක් වුවත් එය ගිණුමට රු.18,666,315 ක් ලෙස හර කිරීම නිසා ලී බඩු හා සවිකිරීම් රු.9,198,401 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයේ මිලදී ගැනීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | ජ' නල් සටහන්වලට අනුව ලී බඩු උපකරණ ශේෂය නිවැරදිව ගිණුමට ගිණුම්ගතවී තිබේ. නමුත් වැරදි ශේෂ සහිත උපලේඛනයක් අමුණා ඇත. |
| (එ) | වෙනත් ආයතන, පුද්ගලයන් වෙත ලබාදීම සඳහා 2019 වර්ෂයේ මිලදීගෙන තිබූ රු.1,049,823 ක් වටිනා උපකරණ, ස්ථාවර වත්කම් යටතේ ඇතුලත්කර තිබීම නිසා ස්ථාවර වත්කම් එම වටිනාකමින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | මිලදී ගැනීමේ අරමුණු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | ජ' නල් සටහන් මගින් නිවැරදි කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | වාහන ලේඛනයට අනුව මෝටර් රථ හා කරත්තවල වටිනාකම රු.268,571,194 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එම අගය රු.176,121,735 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම් රු.92,449,459 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ ලේඛන නිවැරදිව යාවත්කාලීන කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | නගර සභාව සතු සියලුම වාහන ප්‍රත්‍යාගණනය කොට නිවැරදි වටිනාකම ගිණුම්වලට ඇතුලත් කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. |
| (ඔ) | තොග ලේඛනවලට අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට විදුලි ගබඩා තොග ශේෂය හා පොදු ගබඩා තොග ශේෂය පිළිවෙලින් රු.2,497,255 ක් හා රු.34,811,262 ක් වුවද ප්‍රකාශනවල එම ශේෂ පිලිවෙලින් රු.2,185,791ක් හා රු.57,515,377ක් ලෙස දක්වා තිබුණි. | තොග ලේඛන යාවත්කාලීන කර අවසාන ශේෂය නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණන විමසුමට අනුව අදාළ නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. |
| (ඕ) | ගිණුම් විෂයයන් 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන හා අදාළ ලේඛන අතර රු.6,205,649 ක නොසැසඳීම් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශ ශේෂය අනුව උපලේඛන ශේෂයන් නිවැරදි කිරීමට කඩිනමින් කටයුතු කරන ලෙස විෂයභාර නිලධාරී වෙත උපදෙස් දුනි. |
| (ක) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති උප ලේඛන අනුව වියදම් ණයහිමි වෙන්කිරීම් කපා හැරීම් රු.16,757,337 ක් වුවත් පොදු ලෙජරයේ ණයහිමි වෙන්කිරීම් කපාහැරීම් ලෙස වියදම් ණයහිමි ගිණුමට රු.15,176,444 ක් හර කර තිබුණි. | නිවැරදි ණයහිමි වටිනාකම හදුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | ණයහිමි කපාහැරීම් නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස විෂයභාර නිලධාරී වෙත උපදෙස් ලබා දුනි. |
| (ග) | ආදායම් විෂයන් 02 ක ආදායම් අංශයෙන් ලබාදුන් තොරතුරු හා මූල්‍ය ප්‍රකාශන අතර රු. 2,546,638 ක නොසැසඳීම් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශන ශේෂය අනුව ආදායම් අංශයෙන් දුන් වට්ටම් ලේඛන නිවැරදි කිරීමට උපදෙස් ලබා දුනි. |
| (ච) | වටිනාකම රු. 1,041,343,319 ක් වූ ගිණුම් විෂයයන් 25 කට අදාළව ලේඛන, උපලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා කාලවිශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම්ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | අදාළ උපලේඛණ කඩිනමින් විගණනය වෙත ලබාදීමට උපදෙස් ලබා දුනි. |
| (ජ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු. 280,834,516 ක් වූ ණයගැති ශේෂය සඳහා කාලවිශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සභාවේ ආදායම් පනත, අතුරු ව්‍යවස්ථා හා ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ණයහිමි කාලවිශ්ලේෂණ නිවැරදිව සකස් කර විගණනය වෙත කඩිනමින් ලබාදීමට උපදෙස් ලබා දුනි. |

| | | | |
|---|---|---|---|
| (ට) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.481,833,463 ක් වුවද එම ශේෂය ලේඛන/ උපලේඛන සමඟ නොසැසඳුනු අතර ඊට අදාල කාලවිශ්ලේෂණය විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | පසුව පිළිතුරු ඉදිරිපත් කරමි. |

## 1.4 අනුකූල නොවීම්

---------------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | -------------------- | --------------------- | ---------------------- | -------------------------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි<br>----------------------- | | | |
| | මුදල් රෙගුලාසි 1646 | අදාළ මාසික සාරාංශ හා දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. | විධිමත් පරිදි සටහන් කිරීම සඳහා කාර්යය මණ්ඩලය දැනුවත් කරන අතර, නාගරික ඉංජිනේරුගේ අධීක්ෂණය යටතේ කාර්මික නිලධාරි (යාන්ත්‍රික) මගින් රියදුරන් දැනුවත් කිරීමේ සුදුසු විධිමත් ක්‍රමවේදයක් සහ පුහුණු වැඩ සටහනක් සංවිධානය කරන ලෙස දැනුවත් කරමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>----------------------- | | | |
| (i) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009, 2009 ජුනි 17 දිනැති අංක 09/2009(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2017 අප්‍රේල් 19 දිනැති | සියලුම රාජ්‍ය ආයතනවල නිලධාරීන් සිය පැමිණීම සහ පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කළ යුතු වුවද ගණකාධිකාරී | චක්‍රලේඛ විධිවිධාන පරිදි සියළුම නිලධාරීන් කටයුතු කළ යුතුවේ. | අංක NWP/KR/F/KMC/5/19/18 4 – 2 දරණ විගණන විමසුමෙන් පසුව කාර්යාල නිලධාරීන් වේලා සටහන් යන්ත්‍රයේ සටහන් තැබීමට කටයුතු කර ඇති අතර සභාවට ආසන්නයේ පිහිටි |

| | | | | |
|---|---|---|---|---|
| | අංක 3/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපිය | (ආදායම්) හැර සියළු විධායක නිලධාරීන් ඇතුළු ඇතැම් නිලධාරීන් පැමිණීම සහ පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සලකුණු කර නොතිබුණි. | | නිලනිවාසයේ පදිංචිව සිටින නාගරික කොමසාරිස් වශයෙන් කාර්යාල පරිපාලන කටයුතුවලට අමතරව (මහා නගර සභා ආඥා පනතින් සහ වෙනත් අණපනත්වලින් ද මහා සභාවෙන්ද පැවරී ඇති බලතල ප්‍රකාරව) කර්තව්‍යයන් හි සහ අධීක්ෂණයන් හි සීමා රහිත කාලසීමාවක් තුල නියුක්තවීම හේතුවෙන් වේලා සටහන් කිරීම සිදුකරනු නොලබයි. |
| (ii) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ iv ඡේදය | නිවාඩු දින වැටුප් සහ අතිකාල දීමනා ගෙවීමේ දී පැමිණීම සහ පිටවීම වේලා සටහන් මුද්‍රිත මඟින් සනාථ කර ගැනීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි. | ඇඟිලි සලකුණු මුද්‍රිත සටහන් අනුව පැමිණීම, පිටවීම පරීක්ෂා කර බලා ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුවේ. | සති අන්ත සහ නිවාඩු දින වැටුප් ගෙවීම් අනුමත කිරීමේදී අදාල දිනයන්හි කළයුතු වැඩ කොටස් සම්පූර්ණ කර ඇති බව තහවුරු කර ගැනීමෙන් පසු ගෙවීම් අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස අභ්‍යන්තර චක්‍රලේඛයක් මගින් නාගරික දෙපාර්තමේන්තු ප්‍රධානීන් දැනුවත් කරමි. |
| (iii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30 / 2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුවේ. | සභාව සතු වාහනවල ඉන්ධන පරීක්ෂාව නියමිත පරිදි සිදුකරන ලෙස නාගරික ඉංජිනේරු වෙත 2019 ඔක්තෝම්බර් 22 දිනැති ලිපිය මගින් දන්වා ඇත. නැවත ඒ පිළිබඳව විශේෂ දැනුවත් කිරීමක් කරමි. |

**1.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

-----------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාවල සැලසුම් කමිටු දීමනාව රු. 1,000 ක් ගෙවීම සඳහා වයඹ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී තිබුණ ද 2018 ජූනි 05 දිනැති සභා සම්මුතිය මත සැලසුම් කමිටු නිලධාරියෙකුගේ දිනක දීමනාව රු.2,000 දක්වා වැඩිකර තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා කමිටු නිලධාරීන් 09 දෙනෙකුට රු.323,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද කාර්යාල කාර්යය සහායකට හිමි දීමනාව ද රු.300 සිට රු. 1,000 දක්වා වැඩිකර ගෙවා තිබීම නිසා 2019 වර්ෂයේ ජූලි දක්වා රු.25,200 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අනුමැතිය ඉක්මවා සහා තීරණ මත දීමනා ගෙවීම නොකළ යුතුවේ. | සැළසුම් කමිටුවේ සාමාජිකයින් විෂයය භාර නිලධාරි සහ කාර්යාල කාර්යය සහයක ඇතුළු පිරිස සඳහා සැළසුම් කමිටුවේ නිර්දේශ මත මහා සභාවේ අංක G.C(12) සහ 2018 ජූනි 05 දිනැති සහ සම්මුතීන් දී ඇති තීරණය මත ගෙවීම් කරනු ලැබේ. මෙම සහා සම්මුතිය ලබා ගැනීම සඳහාවූ නිර්දේශය නාගරික සංවර්ධන අධිකාරියේ සැළසුම් නිලධාරි සහ මාගී සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරුගෙන්ද සමන්විත කමිටුවේ එකඟත්වය මත තීරණය වූවකි. |
| (ආ) | රජපිහිල්ල තානායමෙන් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු. 5,934,935 ක් විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණි. | විධිමත් අනුමැතියකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් නොකළ යුතුවේ. | දිසා අධිකරණයේ නඩු අංක 26/RE මගින් රජපිහිල්ල තානායම සම්බන්ධව නඩුවක් පවතී. එම නිසා දැනට ආදායම් නොලබන නිශ්ක්‍රීය වත්කමක් ලෙස පවතී. |

**02. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.305,279,341 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.281,518,678ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | මහජන බැංකුවේ ජංගම ගිණුමකට අදාළව 2019 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්ම වූ රු.216,704 ක චෙක්පත් 44 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ගිණුම් අංක 8645 ගිණුමට අදාළව 2019 දෙසැම්බර් 31 දිනට නිකුත්කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් මේ වන විට රු.73,320 වී ඇති අතර මාස 6 ඉක්මවූ චෙක්පත අදායමට ගැනීමට විෂය භාර නිලධාරී වෙත උපදෙස් ලබා දී ඇත. |
| (ආ) | මුදල් රෙගුලාසි 260 ප්‍රකාරව ගෙවීම් ලබන අයගේ අනන්‍යතාවය තහවුරු කරගෙන මුදල් ගෙවිය යුතු වුවත් බැංකු ගිණුම් 04 ට අදාලව අවස්ථා 23 කදී රු.138,540 ක මුදලක් හදුනා නොගත් ගෙවීම් ලෙස බැංකු සැසදුම් ප්‍රකාශනවල දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | හදුනානොගත් ගෙවීම් අතර ගිණුම් අතර මුදල් මාරු වීම නිසා සිදු වූ අයිතමයන්ද ඇති අතර අනෙක් ගෙවීම් කඩිනමින් ඉවත් කරගැනීමට විෂය භාර නිලධාරි වෙත උපදෙස් ලබා දුනි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු ගිණුම් 03 ට අදාල රු.2,147,129 ක් වූ තැන්පත් 70 ක් හදුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තැන්පතු හදුනාගෙන ලේඛනගත කිරීමට කටයුතු කළ යුතුවේ. | මාස 6 ඉක්මවූ හදුනානොගත් ලැබීම් ආදායමට ගැනීමට කටයුතු කිරීමට විෂයභාර නිලධාරි වෙත උපදෙස් ලබා දුනි. |

## 2.3 ආදායම් පරිපාලනය

--------------------

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 වර්ෂය | | | | 2018වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I. වරිපනම් හා බදු | 323,200,000 | 286,398,772 | 237,750,481 | 131,143,630 | 174,446,300 | 176,341,507 | 179,193,292 | 82,495,339 |
| II. බදු කුලී | 74,331,560 | 65,895,321 | 69,980,934 | 8,134,218 | 76,455,955 | 70,803,420 | 74,722,664 | 12,219,831 |
| III. බලපත්‍ර ගාස්තු | 20,201,100 | 20,332,327 | 20,332,327 | - | 16,152,000 | 20,106,771 | 20,106,771 | - |
| IV. වෙනත් ආදායම් | 546,519,160 | 494,929,582 | 478,357,595 | 121,231,133 | 409,861,600 | 476,761,439 | 471,642,735 | 104,659,146 |
| එකතුව | 964,251,820 | 867,556,002 | 806,421,337 | 260,508,981 | 676,915,855 | 744,013,137 | 745,665,462 | 199,374,316 |

**2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 199 ක් වූ හිඟ ආදායම් සමාලෝචිත වර්ෂය වන විට රුපියල් මිලියන 260 ක් වී තිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

**2.3.3 වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට වරිපනම් කොට්ඨාස 12 කට අදාළ බිල්කල ආදායම රු.158,782,386ක් වූ අතර, දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වරිපනම් රු.70,138,502 ක් විය. | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | බොහෝ පාරිභෝගිකයින් තක්සේරු අගය වැඩි කිරීමට විරෝධය පළ කරමින් ගාස්තු නොගෙවන ලදි. තක්සේරු විරෝධතා පරීක්ෂණ 2019 මාර්තු 25 සිට 2019 ජූලි 02 දක්වා පවත්වා ඇත. එම දේපළවලට අදාළ සංශෝධිත වාර්තා 2019 අගෝස්තු 06 දින සිට අපවෙත ලැබී හර බැර කිරීම් මගින් මුල් තක්සේරු අගය අඩු කිරීම මතද මුල් ඉදිරිපත් කළ ආදායම අඩු වී ඇත. මෙම පරීක්ෂණවලට අදාළ කටයුතු 2019 |

| | | | |
|---|---|---|---|
| | | | තුන්වන කාර්තුව අවසානය දක්වාම සිදුකිරීම මත මෙම ආදායම වර්ෂය තුළ ඉපයීමට නොහැකි වී ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ශේෂය රු.61,005,128 ක් වූ අතර එයින් රු.100,000 ට වැඩි හිඟයක් පවතින ජල පාරිභෝගිකයින් 27 කට අදාළව රු.13,538,490 ක් පැවතුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ අයකර ගැනීම සඳහා ද අවසන් නිවේදනය යවා ඇති අතර විසන්ධියට ඉදිරිපත් කරමින් පවතී. |

## 2.3.4 කුලී

---------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු සංචාරක කුලී හා ලොතරැයි කුටි කුලී ශේෂය රු.3,230,060ක් වූ අතර 2020 ජූනි 30 දිනට තවදුරටත් අයවිය යුතු ශේෂය රු.3,083,738 ක් විය. | ගිවිසුම් ප්‍රකාරව නියමිත කුලී අයකළ යුතුවේ. | 2019 දෙසැම්බර් 31 දිනට සංචාරක කුලී හා ලොතරැයි කුටි කුලී හිඟ මුදලින් 2020 ජූනි 31 දිනට රු.146,322ක් අයකර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට කුරුණෑගල නව සාප්පු සංකීර්ණයෙහි කඩ 63කට අදාළව රු.1,004,722ක කඩ කුලී හා කඩ කාමර 64 කට අදාළව රු.520,368 ක සේවා ගාස්තු හිඟයක් පැවතුණි. | ගිවිසුම් ප්‍රකාරව මාසික කුලිය නියමිත දිනට අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර හිඟ ශේෂ සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කුරුණෑගල නව සාප්පු සංකීර්ණයේ සහ අනෙකුත් කඩ කාමරවලට අදාළ කුලී හිඟ මේ වන විට අයකර ගනිමින් පවතින අතර එසේ නොගෙවන කඩ කාමර මුද්‍රා තබා ඇති අතර, මේ වන විට නඩු පැවරීම සඳහා කටයුතු කර ඇත. |
| (ඇ) | කුරුණෑගල බස්නැවතුම්පල කඩ කාමර 62 කින් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු කඩ කුලී ශේෂය රු.902,988 ක් විය. | ගිවිසුම් ප්‍රකාරව මාසික කුලිය නියමිත දිනට අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර හිඟ ශේෂ සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කුරුණෑගල බස්නැවතුම්පොල කඩ කාමරවල කඩ කුලී හිඟ මේ වනවිට අයකරමින් පවතින අතර එසේ නොගෙවන කඩකාමර මුද්‍රා තබා ඇත. මේ වන විට නඩු පැවරීම සඳහා කටයුතු කරමින් ඇත. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට රන්තලිය තානායම බදුදීමෙන් අයවිය යුතු ශේෂය රු.511,875 ක් විය. | ගිවිසුම් ප්‍රකාරව කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | රන්තලිය තානායම සම්බන්ධයෙන් අයවිය යුතු ශේෂය සම්බන්ධව මේ වන විටත් ලිඛිතව දැනුම් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,546,769 ක් වූ පොදු වෙළඳපොල හා අනෙකුත් කඩ කුලී ශේෂය අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව මාසික කුලිය නියමිත දිනට අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර හිඟ ශේෂ සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පොදු වෙළඳපොල හා අනෙකුත් කඩ කාමරවලට අදාළ කඩ කුලී හිඟ මේ වන විට අයකර ගනිමින් පවතින අතර එසේ නොගෙවන කඩ කාමර මුද්‍රා තබා ඇත. මේ වන විට නඩු පැවරීම සඳහා කටයුතු කරමින් ඇත. |

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------------------------- | ---------------------- | ------------------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් රු.17,496,300 ක උසාවි දඩ මුදලක් අයවිය යුතුව තිබුණු අතර, ඒ තුළ පසුගිය වර්ෂ වලට අදාළ රු.10,509,850 ක මුදලක් ද ඇතුළත්ව තිබුණි. | උසාවි දඩ නිවැරදිව ගිණුම්ගත කර අය කළ යුතුවේ. | පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙතින් රු.17,496,300 ක් උසාවි දඩ වශයෙන් අංක 081008 හා 2020 ජූනි 16 දිනැති චෙක්පතින් ලැබුණි. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මුද්දර ගාස්තු ශේෂය රු.37,566,888 ක් විය. | හිඟ මුද්දර ගාස්තු ලබාගත යුතුවේ. | 2020 ජූලි 13 දිනට ප්‍රධාන ලේකම් වෙතින් මුද්දර ගාස්තු ලෙස රු.3,774,8357 ක මුදලක් ලැබුණි. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යය සාධනය**

--------------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 32 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ බැවින් 2019 දෙසැම්බර් 31 දින වන විට අංක 541/17 දරන 1989 ජනවාරි 20 දිනැති සම්මත අතුරු ව්‍යවස්ථා 2015 ජූලි 24 දින වැළඳගෙන තිබුණි. ඊට අමතරව සභාවේ අවශ්‍යතාවය පරිදි 2016 වර්ෂයේදී අතුරු ව්‍යවස්ථා 08ක් ගැසට් කර තිබූ අතර 2013 හා 2014 වර්ෂවලදී අතුරු ව්‍යවස්ථා 08 ක් සකස් කර පළාත් පාලන කොමසාරිස් වෙත ලබා දී තිබුණි. තවද කුරුණෑගල වැව රවුමේ ඡායාරූප ගැනීම වෙනුවෙන් ගාස්තු අයකරන බවට දැන්වීම් ප්‍රදර්ශනය කර තිබූ නමුත් ඊට අදාළ අතුරු ව්‍යවස්ථාවක් පැනවීමට කටයුතු කර නොතිබුණි. | වැළඳගත් අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කිරීමටත්, සභාවේ අවශ්‍යතාවය පරිදි නව අතුරු ව්‍යවස්ථා පැනවීමටත් කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන කොමසාරිස් වෙත අනුමැතිය සඳහා යවන ලද අතුරු ව්‍යවස්ථා 08 සඳහා අනුමැතිය මේ වන විට ලැබී නොමැති අතර මේ වන විට නැවත සිහි කැඳවීම් කිරීම සඳහාත් සම්පාදනයට යෝජිත අතුරු ව්‍යවස්ථා සියල්ල අනුමැතිය සඳහා යැවීමටත් අවශ්‍ය පියවර නාගරික නීති දෙපාර්තමේන්තුව මඟින් ගැනීමට යෝජිතය. |

**(ආ) අයවැයගත කර්මාන්ත ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට රු.20,550,000 ක් වූ කාර්යයන් 52 ක් ඇස්තමේන්තු කර තිබූ නමුත් කාර්යයන් 12ක් පමණක් ඉටුකර තිබුණි. | මහජන යෝජනා මත පිළියෙල කරන අයවැය ලේඛනයේ සඳහන් කර්මාන්ත ක්‍රියාත්මක කර මහජන සේවාව ඉටුකිරීමට කටයුතු කළ යුතුවේ. | නාගරික ඉංජිනේරු සහ නාගරික ගණකාධිකාරී සමග සාකච්ඡා කර පසුව පිළිතුරක් ඉදිරිපත් කරමි. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| i | කුරුණෑගල මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ආවේණියාව වන රක්ෂිතයට අයත් භූමියක පවත්වාගෙන යනු ලබන අතර වර්ගීකරණයකින් තොරව රැස්කරන කසල විවෘත භූමියට බැහැර කිරීම තුල අඩි 45 – 50 ක් පමණ උස නිරන්තර ගිනි ගැනීම්වලට ලක්වන කසල කන්දක් නිර්මාණය වී පැවති අතර පාරිසරික බලපත්‍ර ලබාගැනීමට ද කටයුතු කර නොතිබුණි. | කසල කළමනාකරණය විධිමත්ව සිදුකිරීමට කටයුතු කළ යුතුවේ. | නාගරික බලප්‍රදේශයට තදාසන්න අපද්‍රව්‍ය මධ්‍යස්ථානයකට සුදුසු වෙනත් විකල්ප ස්ථානයක් සොයාගැනීම අතිශයින් දුෂ්කර කාර්යයකි.<br>ස්වාභාවිකව ඇති වන ගිණිගැනීම් වැළැක්වීම සහ මර්ධනය කිරීම සඳහා නාගරික ගිණි නිවීමේ ඒකකයට අවශ්‍ය මානව සම්පත් සහ උපකරණ ලබා දී ඇති අතර පැය 24 මුළුල්ලේම සූදානම් රාජකාරියේ තබා ඇත. |
| ii | විද්‍යුත් අපද්‍රව්‍ය හා සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | කසල කළමනාකරණය විධිමත් කිරීමට කටයුතු කළ යුතුවේ. | විද්‍යුත් අපද්‍රව්‍ය බැහැර කිරීමේ මධ්‍යස්ථානය සඳහා දහනාගාරයක් ඉදිකිරීමට අවශ්‍ය සැළසුම් සකස් කර ඇති අතර එය ස්ථාපනය වීමෙන් පසු මෙම ගැටළුවට විසඳුමක් ලැබෙනු ඇත.<br>සායනික අපද්‍රව්‍ය තුළින් පැම්පස්, ගෝස් වැනිකොටස් මධ්‍යස්ථානය තුලදී සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අනුගමනය කරමින් මිහිදන් කරනු ලැබේ. |

**(ඈ) පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මල අපද්‍රව්‍ය කසල කන්ද මත පිහිටි විවෘත භූමියට මුදා හැරීමට කටයුතු කර තිබුණි. | පරිසර පද්ධතීන්ට සිදුවන හානි අවම වන පරිදි කසල බැහැර කිරීම් විධිමත් කිරීමට කටයුතු කළ යුතුවේ. | මහා නගර සභාවේ මළ අපවහන පිරිසිදු පද්ධතිය වෙත ලැබෙන අපද්‍රව්‍ය ප්‍රමාණය ධාරිතාව ඉක්මවා යාමට ආසන්නව පවතින බැවින් විකල්ප ක්‍රියාමාර්ගයක් වශයෙන් විසල් කුරුණෑගල අප ජලය ව්‍යාපෘතිය වෙත යොමු කිරීමට සැළසුම් සකස් කිරීමට යෝජිතය. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත් වී තිබුණු අතර තිරසර සංවර්ධන අරමුණු 06 ක් ළඟා කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුල දී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක අනුව වාර්ෂික අයවැය සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | සියළුම තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ආවරණය වන පරිදි සභාව විසින් වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇති අතර 2021 අයවැය ලේඛණය තුලින් ද අරමුණු හා ඉලක්ක වඩාත් ප්‍රවර්ධනය වන පරිදි ඇස්තමේන්තු සකස් කිරීමේදී සුවිශේෂී අවධානය යොමු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | කුරුණෑගල බස් නැවතුම්පොලෙහි හිස් අවකාශවල ඇස්තමේන්තු වටිනාකම රු.14,232,000 ක් වූ කඩ 18 ක් ඉදිකර ගැනීම සඳහා නගරාධිපතිවරයා විසින් සෘජුවම ආණ්ඩුකාරවරයාගෙන් අනුමැතිය ලබාගෙන කඩ කාමර ලබාදෙන ලෙස ඉල්ලීම් කළ ඉල්ලුම්කරුවන්ට ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ලබාදීමට කටයුතු කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි අදාළ දැන්වීම් ප්‍රසිද්ධ කර තරඟකාරී මිල ගණන් මත ලබාදීමට කටයුතු කළ යුතුවේ. | වයඹ ආණ්ඩුකාරවර ලේකම්ගේ NWP/GOV/AD/08/44/1/1 – II වෙළුම හා 2019/10/14 දිනැති ලිපියේ 03 ඡෙදයෙහි "නිසි සැලැස්මකට අනුව කඩ කාමර ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ලෙසත් විධිමත් ගිවිසුමකට අනුව කඩ කාමර ලබා දීමට කටයුතු කරන ලෙසත් ගරු ආණ්ඩුකාරතුමා විසින් දන්වා ඇති බව" අවධාරණය කර ඇත.<br>වයඹ පළාත් ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කර ලබා දුන් ලේඛණයේ සඳහන් පුද්ගලයින් වෙත කඩකාමර බදු පදනමින් පවරන ලදි. |
| (ආ) | බස්නැවතුම්පල තුළ අමානෝ මීටි යොදාගෙන අනවසර ඉදිකිරීම් සිදුකර තිබූ නමුත් ඒ පිළිබඳව 2020 ජූනි 30 වන විටත් කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රධාන ආදායම් පරීක්ෂක විසින් මෙම ඉදිකිරීම අවසර ලබා ගෙන ඉදිකර ඇති බවටත් ඉදිරියේදී බිල් ගෙවීම් සිදු කරන බවට අදාළ ව්‍යාපාරිකයා පැවසූ බවටත් වාර්තා කර ඇත. තාවකාලික වෙළඳ කුටියක් ඉදිකර ගැනීම සඳහා අවසර ලබා ගැනීමට එම ව්‍යාපාරිකයා විසින් 2020 පෙබරවාරි 03 දින ලිපියකින් ඉල්ලීමක් කර ඇත. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

#### (අ) අනුමත සේවා ව්‍යවස්ථාවක් නොමැතිව බඳවා ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2012 දෙසැම්බර් 31 දිනට ගිනි නිවන අංශය සඳහා තනතුරු 05 කට අදාළව සේවකයින් 36 ක් අනුමත කර තිබූ නමුත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර නොතිබූ බැවින් බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. වෙනත් සේවාවල ස්ථිර සේවකයින් හා කොන්ත්‍රාත්, අනියම්, ආදේශ පදනම මත බඳවා ගත් සේවකයින් 18 ක් යොදාගෙන මෙම සේවාව ඉටුකර තිබුණි. | බඳවාගැනීමේ පරිපාටියක් අනුමත කරගෙන විධිමත් පත්වීම් ලබාදීමට කටයුතු කළ යුතුවේ. | පුහුණු නිලධාරියෙකු යටතේ ගිණි නිවන අංශය සංවිධානය වී ඇති අතර සේවාව යහපත් මට්ටමින් පවත්වාගෙන යනු ලබයි. පුරප්පාඩු තනතුරු ඉදිරියේ දී සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය. |

#### (ආ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 පෙබරවාරි 25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවන ලෙස සහා තීරණ පරිදි දෛනිකව රු. 1000, රු. 1,200, රු. 1,400 සහ රු.2,000 වැනි දීමනා මත හා මාසිකව රු.21,400, රු. 40,000 හා රු. 45,000 වැනි දීමනා මත අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 2018 හා 2019 වර්ෂ තුළදී අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 180 දෙනෙකුට 2019 වර්ෂය තුළ රු. මිලියන 56 ක් ගෙවීම් කර තිබුණි. මෙලෙස බඳවාගත් සේවකයින්ට ප්‍රමාණවත් කාර්යභාරයක් පවරා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව බඳවා ගැනීම් කර ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුවේ. | දෛනික සහ මාසික දීමනා මත බඳවාගන්නා ලද සියළුම සේවකයින් සඳහා ගෙවීම් තීරණය කරන ලද්දේ සභා තීරණ මත වේ. |

(ඇ) සේවක ණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට සේවය හැර ගිය නිලධාරින් 03 දෙනෙකුගෙන් රු.61,374 ක්, මියගිය හා විශ්‍රාම ගිය නිලධාරින් 15 දෙනෙකුගෙන් රු.1,487,276 ක් හා ස්ථාන මාරුවී ගිය නිලධාරින් 06 දෙනෙකුගෙන් රු.295,235 ක් වශයෙන් ණය ශේෂ අයවීමට තිබුණි. | හිඟ ණයශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ණය ශේෂයන් අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු පරීක්ෂා කරමින් පවතී. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | මහා නගර සභාව සතුව ප්‍රමාණවත් මුදල් පැවතියදී බස් නැවතුම්පල කඩ කාමර ඉල්ලුම්කරුවන්ට සකස් කරගැනීමට අවස්ථාව ලබා දී තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු ගිවිසුමකට ඇතුලත්ව නොතිබුණි. | කඩ කාමර ඉදිකිරීම හා බදුදීම චක්‍රලේඛ හා ප්‍රසම්පාදන විධිවිධාන ප්‍රකාරව සිදුකළ යුතුවේ. | මෙම කඩකාමර ඉදිකිරීම සඳහා 2019 අයවැය ලේඛණයෙන් ප්‍රතිපාදන වෙන්වී නොතිබූ හෙයින්ද බදුකරුවන් වෙතින් කඩකාමර ඉදිකර ගැනීමට මූල්‍යමය හැකියාව ඉදිරිපත් වූ බැවින් එම පදනම සැළකිල්ලට ගෙන ඔවුන්ට ඒවා ඉදිකිරීමට අවස්ථාව ලබාදෙන ලදි. කඩ කාමර වෙනුවෙන් ගිවිසුම්ගතවීම සඳහා අංක SFC/34 හා 2019 සැප්තැම්බර් 19 දරණ මුදල් කමිටු තීරණයෙන් අනුමැතිය ලැබී ඇති අතර මාසික කුලී ගාස්තුව ප්‍රධාන තක්සේරුකරුගෙන් ලබාගත් තක්සේරුව මත තීරණය විය. |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරියේ හෝ නගර සභා සැලසුම් කමිටුවේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | සභා බල ප්‍රදේශයේ ඉදිකිරීම් සිදුකිරීමට අදාළ අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | කඩ කාමර ඉදිකිරීම සඳහා නාගරික ඉංජිනේරුවරයා විසින් සකස් කර අනුමත කරන ලද සැළැස්ම අනුව සිදු කරන ලදි. එම සැළැස්ම පිළිබඳව G.C.(30) 2019.02.12 දරණ සභා සම්මුතියට ද ඇතුලත්ව තිබූ අතර ගරු ආණ්ඩුකාරතුමාගේ සෘජු අනුමැතිය සහිත ලිපියෙන් ද ආවරණය ලැබී ඇත. |

## 3.5 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වයඹ පළාතේ සියළුම පළාත් පාලන ආයතනවල සභිකයින් සඳහා සන්නිවේදන දීමනාවක් වශයෙන් මසකට රු. 3,000 ක දීමනාවක් පළාත් පාලන ආයතන අරමුදලින් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබී ඒ අනුව අදාල ගෙවීම් කර තිබියදී නියෝජ්‍ය නගරාධිපති ඇතුළු නාගරික මන්ත්‍රීවරුන්ගේ දුරකථන බිල්පත් පියවීම වෙනුවෙන්ද 2018 වර්ෂයේ මැයි සිට දෙසැම්බර් දක්වා රු.214,115 ක් හා 2019 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු.595,503 ක් ගෙවා තිබුණි. | එකම වියදමක් වෙනුවෙන් සභා අරමුදලින් වවුවර 02 කින් ගෙවීම් කිරීම නොකළ යුතුවේ. | මහා නගර සභා ආඥා පනතේ අංක 188 (ගග) අනුව සභාවේ සභිකයින් සඳහා දුරකථන ගෙවීම් කිරීම සඳහා සළසා ඇති ප්‍රතිපාදනයන් සහ 2015 මාර්තු 10 දිනැති ම.ස.6(37) දරණ සභා සම්මුතිය ද සැළකිල්ලට ගෙන මාසිකව රු.5,000 සහ රු3,000 බැගින් දුරකථන සහ සන්නිවේදන දීමනා ගෙවා ඇත. |
| (ආ) | බස්නැවතුම්පොලෙහි ඉදිකරන ලද නව කඩ කාමර පවරාදීමේ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව බදු ගැනුම්කාර පක්ෂය විසින් පැවරීම, විකිණීම හෝ අතුරු බදු දීම නොකළ යුතු වුවද, අවම මාසික කුලිය රු.17,250, රු.17,250, රු.25,000 හා රු.24,000 බැගින් වූ කඩ කාමර 04 ක් වැඩි වටිනාකම් මත අතුරු බදු දී තිබුණි. | බදු ගිවිසුම් කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පවරාදීමේ ගිවිසුම් ප්‍රකාරව රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත බදු කරුවන්ට බදු දී ඇතත් අතුරු බදු දීම් ඇත්ද යන්න පිළිබඳව ආදායම් පරීක්ෂකවරුන් මඟින් පරීක්ෂාවට ලක්කර විගණනයට වාර්තා කරමි. |

## 3.6 වත්කම් කළමනාකරණය

### නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ දී බාහිර ආයතනයක රු.3,050,000 ක ප්‍රතිපාදන මත මහා නගර සභා පොළ භූමියේ ඝන මීටර් 70ක ධාරිතාවයෙන් යුත් ජීව වායු ඒකකයක් ඉදිකර තිබූ නමුත් එහි ප්‍රතිලාභයන් ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා වර්තමානය වන විට නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | ජීව වායු ඒකකයේ ටැංකි 02 ක් ස්ථාපිත කර ඇති අතර එක් ටැංකියක් පළුදුවීම නිසා ජනනය වන වායුව ගබඩා කර තැබීමේ අපහසුතාවයක් පවතී. නැවත අළුත් වැඩියාකර ක්‍රියාත්මක කිරීමට යෝජිතය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රතිපාදන මත රු. ලක්ෂ 80 ක් වැයකර පසු භාවිත ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියක් ආරම්භ කර 2012 වර්ෂයේ දී ප්ලාස්ටික් කැබලිවලට කැපීම හා ප්ලාස්ටික් උණු කිරීම සඳහා යන්ත්‍ර 02 ක් ද සවිකර තිබුණි. එම යන්ත්‍ර 2014 වර්ෂයේ දී පමණ අක්‍රීය තත්ත්වයට පත්වී තිබුණු අතර නැවත අළුත්වැඩියා කළද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයට එකතුවන ප්ලාස්ටික් ද්‍රව්‍ය අලෙවියෙන් ලැබෙන ආදායම යන්ත්‍රය ක්‍රියාත්මක කර ප්ලාස්ටික් නිෂ්පාදන (කැබලි කර) අලෙවියෙන් ලැබෙන ආදායමට වඩා ඉහළ අගයක් ගනී. එබැවින්, යන්ත්‍රය ක්‍රියාත්මක කර ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම ඵලදායී තත්වයක් නොවේ. |

**3.7 ආර්ථික නොවූ ගණුදෙනු**

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 07 දිනැති හා 2015 සැප්තැම්බර් 25 දිනැති ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛ ප්‍රකාරව ආයතනවල පැවැත්වීමට අවශ්‍ය ස්වකීය වැඩසටහන් අවම පිරිවැයක් යටතේ සංවිධානය කිරීමට කටයුතු කළ යුතු වුවද, ඊට අනුකූල නොවන පරිදි 2018 දෙසැම්බර් මාසයේ දී අහුංගල්ල ප්‍රදේශයේ පිහිටි හෝටලයක වැඩමුළුවක් පවත්වා රු.490,690 ක් වැයකර තිබුණි. තවද විධිමත් ප්‍රසම්පාදන ක්‍රමයකින් තොරව ස්ථානය තෝරාගෙන තිබුණි. | අවම පිරිවැයක් යටතේ මහජන මුදල් වැය කළ යුතුවේ. | නාගරික සංවර්ධන අධිකාරි පනතේ සංශෝධනවලට අදාළව පැවරී ඇති රෙගුලාසිවලට සහ ජාතික භෞතික සැළසුම් ප්‍රතිපත්තියට අනුකූලව කුරුණෑගල නගර සංවර්ධනය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා (පුහුණු වැඩමුළුවක් ලෙස) නාගරික මන්ත්‍රීවරුන්ගේ යෝජනාවක් පරිදි මෙම වැඩමුළුව සංවිධානය කරන ලදි. ඒ සඳහා සුදුසු නගරයෙන් පිටත නිදහස් පරිසරයක නේවාසිකව පැවැත්වීම වඩාත් සුදුසු බවත්, ඊට වැයවන වියදම් සභා අරමුදලින් දැරීම සුදුසු බවත් අංක GC-5(II) – 2018.12.04 දිනැති සභා සම්මුතිය පරිදි මෙම පුහුණු වැඩමුළුවට අනුමැතිය ලැබුණි. |

**3.8 ප්‍රසම්පාදනය**

-------------

**3.8.1 කොන්ත්‍රාත් පරිපාලනය**

-----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉලුප්පුගෙදර පාර ජලනල එළීමේ කර්මාන්තයේ වැඩ විෂයයය අංක 02 යටතේ පීවීසි නළ මතට ගංගා වැලි යෙදීමට රු. 612,779 ක් ගෙවා | ඉටුනොකල වැඩ සඳහා කළ ගෙවීම් ආපසු අයකළ යුතුවේ. | කොන්ත්‍රාත්කරු විසින් ඝනමීටර් 78 වැලි ප්‍රමාණයක් වැඩ බිමට සැපයු අතර ඒවා වාහන මිණුම් ලෙස ගන්නා ලදි. එම වැලි සියල්ල කාණුවේ පතුල මතට |

| | | | |
|---|---|---|---|
| | තිබූ නමුත් භෞතික පරීක්ෂාවේදී ගංගා වැලි යොදා නොතිබුණු ස්ථාන හා ගංගා වැලි අඟලක පමණ ඝනකමට යොදා තිබුණු ස්ථාන පැවතුණි. ඒ අනුව නොකළ වැඩ සඳහා රු.510,649 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | මිලිමීටර් 37.50 පමණ ද ඒ මත එලන ලද නළයට වැසී ගොස් නළයට ඉහලින් වැලි තට්ටුව කුඩා ප්‍රමාණයෙන් උස හා පළල වෙනස් වන ස්ථාන තිබෙන්නට හැකි මුත් ඒ අනුව අවශ්‍යතාවය සපුරාලමින් ගෙනෙන ලද සියළු වැලි ප්‍රමාණ නාගරික ඉංජිනේරු(ජල) උපදෙස් හා තාක්ෂණ නිළධාරි අධීක්ෂණය යටතේ සිදු කර ඇත . |
| (ආ) | ඉලුප්පුගෙදර මාර්ගයේ ජල නළ එලීමේ පළමු කොන්ත්‍රාත්තුව නිම කිරීමෙන් පසු මාර්ගයේ ගිලා බැසීම් හේතුවෙන් කාපට් කිරීම සඳහා ජල නළ එලන ලද කාණු හාරා පස් ඉවත් කර වැසීමට රු.4,000,000 ක නව ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. මෙම මාර්ගය කාපට් කරන බව සභාව දැනුවත්ව තිබියදී ජල නළ එලීම සඳහා එකම වැඩ විෂයයන් වෙනුවෙන් ඇස්තමේන්තු 02 ක් සකස් කර ගෙවීම් සිදුකර තිබීමෙන් පළමු ඇස්තමේන්තුවේ වැය විෂයයන් 03 ක් වෙනුවෙන් දරන ලද රු.1,208,305 ක වියදම සභාවේ නොසැලකිල්ල මත දැරීමට සිදු වූ වියදමක් විය. | මහජන මුදල් ආර්ථිකව, කාර්යක්ෂමව ඵලදායී ලෙස වැය කිරීමට කටයුතු කළ යුතුවේ. | කර්මාන්තයක් ආරම්භ කිරිමේ දී මහා නගර සභා ක්‍රමවේදයට අනුව ඇස්තමේන්තු සකස් කර, ඇස්තමේන්තු පරීක්ෂා කර, කර්මාන්ත කමිටු, මුදල් කමිටු වෙත යොමු කර මහා සභාවේ අනුමැතිය ලැබුණු පසු ප්‍රසම්පාදන ඒකකයට යොමු කර, ප්‍රසම්පාදනය කර, අවශ්‍ය වුවහොත් නැවත, නැවත ප්‍රසම්පාදනය කර කොන්ත්‍රාත්කරු තෝරා ගිවිසුම්ගතවීම සඳහා කාලයක් ගතවීම හේතුවෙන් මෙය සිදු වී ඇත. |
| (ඇ) | පුබුදු මාවත 2 පටුමග කාණු බැඳ තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.1,574,243 කට ගිවිසුම් ගත වී තිබූ නමුත් වැඩ විෂයය අංක 11 සිට 16 දක්වා වූ රු.679,457 ක කාණු බැඳීම සිදුකර නොතිබුණු අතර මාර්ගයට තාර ඇතිරීම පමණක් සිදුකර තිබුණි. තාර දැමූ මාර්ගයේ ස්ථාන කිහිපයක තාර ගැලවෙමින් ගල් මතුවී තිබුණි. | ඇස්තමේන්තු ප්‍රකාරව කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | කොන්ත්‍රාත්කරු අදාළ කර්මාන්තය ඉදිකිරීම් නිම කළ පසු අප ජල ව්‍යාපෘතිය මගින් මාර්ගයේ නැවත කැනීම් සිදු කළ අතර, එමගින් සිදු වී ඇති අලාභ හානි නැවත සකස් කර දෙන ලෙස අදාළ ජල ව්‍යාපෘතිය සිදු කළ නිලධාරීන් දැනුවත් කර ඇත. රැඳවුම් මුදල් නිදහස් කර නොමැත. |

## 04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වර්ෂයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 12 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. | රට තුල උද්ගත වී ඇති කොවිඩ් 19 වසංගතය හමුවේ කාර්යාලයේ නිලධාරියෙකුගේ රාජකාරීන්හි යම් මන්දගාමී ස්වභාවයක් ඇති වූ බැවින් එසේ වුවද 2021 වර්ෂයේ නියමිත කාලවකවානු තුල වාර්ෂික මූල්‍ය ප්‍රකාශණය ඉදිරිපත් කිරීමට අදාළ අංශ දැනුවත් කරමි. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව තුළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් යුත් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබූ නමුත් අභ්‍යන්තර විගණන සැලැස්ම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි විගණන කටයුතු සිදුකර නොතිබූ අතර අභ්‍යන්තර පාලන පද්ධතිය සාර්ථකව ඇගයීමට ලක්කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක කළ යුතුවේ. | අභ්‍යන්තර විගණන සැළැස්මට අනුකූලව සභාවේ ක්ෂේත්‍ර කීපයක් ම ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන වාර්ථා 12ක් මේ වන විට නිකුත් කර ඇත. |

### 4.3 පිළිතුරු නොදුන් විගණන විමසුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක් විගණන විමසුමක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට කටයුතු කළ යුතුවේ. | කෙටුම්පත් වාර්තාවට පිළිතුරු ඉදිරිපත් කර ඇත. |